(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 11.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 ජූලි මස 07 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0032/'09

1\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 අගෝස්තු 03 දින සිට 2008 අගෝස්තු 31 දින දක්වා සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගම වෙත භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ණය මුදල් කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එලෙස 2007 අගෝස්තු 03 දින සිට ලබා දී ඇති එක් එක් ණය මුදල සඳහා අදාළ නියමයන් හා කොන්දේසි සඳහන් කරමින් භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ලිපි එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 1997 සිට 2008 අගෝස්තු 31 දින දක්වා එම එකිනෙක ණය මුදල වෙනුවෙන් ගෙවීමට ඇති මුල් මුදල සහ පොළී ප්‍රමාණය කොපමණද;

(ii) 2008 අගෝස්තු 31 වැනි දිනට සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගම විසින් ජපානයට ගෙවිය යුතුව තිබූ, රජය විසින් සහතික කරන ලද ණය මුදල් සහ එම ණය මුදල් ගෙවිය හැකි දිනය කවරේද;

(iii) 2008 මාර්තු 31 වැනි දින දක්වා වූ පසුගිය වසර 10 තුළදී ලබා ගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු වාර්ෂික පොළිය ගෙවීමෙන් පසු සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගමේ වාර්ෂික ශුද්ධ ලාභයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගමට 1997 සිට මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ණය මුදල් ආපසු ගෙවීම සම්පූර්ණයෙන්ම පැහැර හැර තිබේද;

(ii) 1999 ජූලි මස අංක 673 සහ 674 දරන විශේෂ ප්‍රදාන සාධන පත්‍ර හිමිකම අත්හැරීම ප්‍රකාරව හිල්ටන් හෝටලය පිහිටි ඉඩම රජයට අයත්ද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඉ) රජයට අයත් මෙම ඉඩම භාවිතා කිරීම වෙනුවෙන් සීමාසහිත හොටෙල් ඩිවෙලපර්ස් (ලංකා) සමාගම හෝ හිල්ටන් හෝටලය විසින් ගෙවීම් සිදු නොකිරීමට හේතුව කුමක්දැයි එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0158/'09

2\.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව මහවැලි නව සංවර්ධන කලාපය තුළ 2004 සිට 2009.03.31 දක්වා ලබා දුන් බිම් කට්ටි සංඛ්‍යාව වාර්ෂිකව කොපමණද;

(ii) ඉඩම්ලාභීන් තෝරාගත් නිර්ණායක හා ලබාදුන් සම්පූර්ණ බිම් ප්‍රමාණය ගොඩ/වාරි වශයෙන් වෙන් වෙන්ව කොපමණද;

(iii) සුදුසුකම් සපුරා තිබියදීත් ඉඩම් ලබාදීමට නොහැකිවූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික ව්‍යාපාර වෙනුවෙන් සමාගම් හෝ වෙනත් ආයතනවලට ඉඩම් ලබාදී තිබේද;

(ii) එසේනම්, එලෙස අයදුම් කරන ලද සමාගමේ/ආයතනයේ ප්‍රධානියාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) එම ඉඩම් ලබාදීමට තිබිය යුතු සුදුසුකම් හා නිර්ණායක, ඉඩම් ලබාදුන් දිනය සහ ලබාදුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ලබාදුන් ඉඩම් යොදාගත් කාර්යය හා ඒ කවර කාලසීමාවක් සඳහාද;

(v) එම ඉඩම් නිශ්චිත කටයුතු සඳහා යොදවා තිබේද;

(vi) එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එක් එක් ඉඩමට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2009.03.31 දිනට බෙදාදීම සඳහා (ගොඩ/වාරි) ඉතිරිව ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(ii) අනිවාර්යයෙන්ම ඉඩම් ලබාදිය යුතු අය හඳුනාගෙන තිබේද;

(iii) එසේනම්, එම ප්‍රමාණය කොපමණද;

(iv) කවර කාලසීමාවක් තුළ ඔවුන්ට ඉඩම් ලබාදෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0178/'09

3.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපේ රටේ පවත්නා ක්‍රීඩා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් වෙන් වෙන් වශයෙන් අයත්වන්නේ පළාත් සභාවලටද නොඑසේ නම්, මධ්‍යම රජයට ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් දිස්ත්‍රික්කය අනුව අදාළ පාසල්වල නාමලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙම "ක්‍රීඩා පාසල්" සංවර්ධනය සඳහා විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) නොඑසේ නම්, වෙනත් කවර හෝ අමාත්‍යාංශයක් මගින් ක්‍රියාත්මක කරන එවැනි ව්‍යාපෘතියක් තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iv) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ක්‍රීඩා පාසල් කවරේද;

(v) අදාළ පාසල් තෝරාගැනීමේ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0209/'09

4.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජපානයේ විශේෂ සාම නියෝජිත යසුෂි අකාෂි මහතා ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන වාර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ මහතා ශ්‍රී ලංකාවට පැමිණි දිනයන් සහ එලෙස පැමිණියේ කවර කටයුතු සඳහාද;

(ii) ඒ මහතා ශ්‍රී ලංකාවට පැමිණ සාකච්ඡා පැවැත්වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0266/'09

5\.

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයට මාසික කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර කාර්යයක් සඳහාද;

(iii) ඒ ඒ ගොඩනැගිලි සඳහා ගෙවන මාසික කුලිය වෙන වෙනම කොපමණද;

(iv) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(v) එම ගොඩනැගිලි ලබා ගන්නේ කවර ආකාරයටද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) දෙහිවල, ගාලුපාර, අංක 04 දරන ලිපිනයෙහි පිහිටා ඇති ගොඩනැගිල්ල කවර ආයතනය සඳහා මිලදී ගෙන තිබේද;

(ii) ඒ කවර වර්ෂයේ සිටද;

(iii) එහි මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0268/'09

6\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රී රෝද රථ රියදුරන් සඳහා පෙට්‍රල් සහනාධාරයක් ලබාදීමට රජය තීරණයක් ගත් බවත්;

(ii) ඒ සඳහා චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්;

(iii) එම චක්‍රලේඛයට අනුව සහනාධාරය ලබා ගැනීමට ඉදිරිපත් වූ සංඛ්‍යාව ඉතා අවම බවත්;

(iv) එයට හේතුව සහනාධාරය ඉල්ලුම් කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහා අයදුම් කිරීම සංකීර්ණ කිරීම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ මෙතෙක් පෙට්‍රල් සහනාධාරය ඉල්ලුම් කළ සංඛ්‍යාව කොපමණද;

(ii) සහනාධාරය ලබාගත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0351/'09

7\.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගා/ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට පවත්වාගෙන යනු ලබන දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දහම් පාසල්වල නම් හා එම දහම් පාසල් පවත්වාගෙන යන විහාරස්ථාන වල නම් පිළිවෙළින් කවරේද;

(iii) එම එක් එක් දහම් පාසලේ ප්‍රධානාචාර්ය හිමිගේ හෝ ප්‍රධානාචාර්යවරයාගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් දහම් පාසලේ දහම් අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දහම් පාසල්වල සිසුන්ගේ අවශ්‍යතාවයට අනුව මේස - පුටු තිබේද;

(iii) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා මෙම දහම් පාසල් සඳහා වාර්ෂිකව විමධ්‍යගත හෝ පළාත් සභා ප්‍රතිපාදන මුදල් කොපමණ ප්‍රමාණයක් වෙන්කර තිබේද;

(iv) ඒ කවුරුන් විසින්ද;

(v) සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙන් හෝ රජයේ වෙනත් අරමුදල්වලින් ඉහත දහම් පාසල් සඳහා වෙන්කර තිබෙන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම දහම් පාසල්වල අඩුපාඩු 2009 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0059/'09

8.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "අපි වෙනුවෙන් අපි" අරමුදල සඳහා රු. 100,000/- ට වැඩි මුදල් පරිත්‍යාග ලබා දුන් රජයේ දෙපාර්තමේන්තුවල නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආරක්ෂක හමුදා සාමාජිකයන් වෙනුවෙන් ඉදිකරන ලද එක් නිවසක පිරිවැය කොපමණද;

(ii) ඒ සඳහා අරමුදල් සපයා ගත්තේ කෙසේද සහ එම අරමුදල් සැපයූ මූලාශ්‍ර කවරේද;

(iii) මෙම නිවාස ලබා ගැනීම සඳහා සෙබළුන් හෝ ආරක්ෂක හමුදා සාමාජිකයින් විසින් දැරිය යුතු සම්පූර්ණ වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0160/'09

9.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0179/'09

10.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපේ රටේ දැනට පවත්නා අධ්‍යාපන විද්‍යා පීඨ සංඛ්‍යාව කොපමණද; සහ

(ii) එම එක් එක් විද්‍යා පීඨය මගින් ක්‍රියාත්මක කරන පාඨමාලා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා එක් එක් පාඨමාලාව සඳහා වාර්ෂිකව ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත විද්‍යා පීඨවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමානුකූලව අවම කිරීමට රජය තීරණයක් ගෙන තිබේද;

(iii) දැනට ක්‍රියාත්මක සමහර පාඨමාලා අහෝසි කිරීමට හෝ විද්‍යාපීඨ වසා දැමීමට රජය තීරණයක් ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0211/'09

11.

ගරු ජේමසිරි මානගේ මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැංගුරම් පොළවල් හා ධීවර වරායන් ආශ්‍රිතව ටින් මාළු කර්මාන්තශාලා ආරම්භ කරන බවට "මහින්ද චින්තනයේ" සඳහන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) "මහින්ද චින්තනයෙන් " පසුව ආරම්භ කර තිබෙන ටින් මාළු කර්මාන්ත ශාලා සංඛ්‍යාව සහ ඒවා ආරම්භ කළ දිනයන් කවරේද;

(ii) එම කර්මාන්තශාලා ආරම්භ කර තිබෙන ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) එම කර්මාන්තශාලාවල නිෂ්පාදන ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0269/'09

12.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෝට්ටේ රාජගිරිය මංසන්ධියේ මාර්ග සංඥා පද්ධති සවි කරන ලද්දේ කවදාද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) මාර්ග සංඥා පද්ධති සවි කරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග සංඥා ලාම්පු ක්‍රියාත්මක කළ දින සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එකී සංඥා ලාම්පු ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මේ නිසා මහජන මුදල් නාස්තියක් සිදු වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0352/'09

13.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 සුනාමි ව්‍යසනයෙන් විනාශ වූ හික්කඩුව, තෙල්වත්ත පැරලිය ප්‍රදේශයේ නිවාස වෙනුවට එවකට සිටි ධීවර අමාත්‍යතුමාගේ යෝජනාවක් අනුව කොපමණ නිවාස සංඛ්‍යාවක් සෑදීමට කටයුතු කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විවිධ රාජ්‍ය නොවන ආයතන මගින් එම ප්‍රදේශයේ නිවාස සෑදීම බාරගෙන තිබූ අතර ඔවුන්ට නිවාස සාදා ගැනීමට වැඩ පිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් ඉහත නිවාස සෑදීම ආරම්භ කිරීමට සිදුවූ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම නිවාස හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) සාදා ඇති එම නිවාසවල බිම් මහලේ වැඩ නිමකර තිබේද;

(iii) නොඑසේ නම්, අදාළ නිවාසලාභීන්ට පදිංචිවීමට සුදුසු පරිදි බිම් මහලේ වැඩ නිමකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙම නිවාසලාභීන්ගෙන් වැඩි පිරිසක් තමන්ට අයිතිව තිබූ සියලුම දේ අහිමිවූ අය වන අතර මේ දක්වා ස්ථිර ආදායම් මාර්ගයක් ද නොමැති අය වන බැවින් ඉහත නිවාසවල ඉතිරි අඩුපාඩු සකස් කිරීම කවර කාලසීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0067/'09

14.

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්තමානයේදී රජයේ රූපවාහිනී විකාශන ආයතන සහ පෞද්ගලික සමාගම්වලට රූපවාහිනී විකාශනය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (ශ්‍රී. ල. රූ. ස.) පනත යටතේ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවද දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නියාමනය වී ක්‍රියාත්මක වන්නක් වන බැවින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම අනෙක් බලපත්‍රලාභීන්ට හා අයදුම්කරුවන්ට අසාධාරණයක් වන අතර සාධාරණ වෙළඳාම හා සම අවස්ථා සැලකීමේදී ලෝක වෙළඳ සංවිධානය (W.T.O.) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග අත්සන් කරන ලද ගිවිසුම් උල්ලංඝණය කිරීමක්ද වන බව ගරු අමාත්‍යතුමා දන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්තමානයේදී රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීමට යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ අදාළ විධිවිධාන අවලංගු කර එම විධිවිධාන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ හෝ ඒ හා සමාන පනතක් යටතේ යළි හඳුන්වා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0215/'09

15.

ගරු පේමසිරි මානගේ මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෑස් සිලින්ඩරයක (12.5 Kg) වර්තමාන වෙළෙඳපොළ මිල කොපමණද;

(ii) ෂෙල් ගෑස් සමාගම සහ ලාෆ් ගෑස් සමාගම පවත්වාගෙන යන ව්‍යාපාරිකයින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ගෑස් කිලෝග්‍රෑම් එකක් සපයන මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන),— 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පරිපූරක මුදල — ශීර්ෂය 149 — වැඩසටහන 2,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2009 ජුනි 26),— " † 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙසීයයකට (රු. 200,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 149 | — | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන |
| | | | මූලධන වියදම් රු. 200,000,000 |
| | | | රු. 200,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජූනි මස 12 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සහ 2 එකතුව රුපියල් 2,749,830,000.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 ජූලි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 243— වැඩසටහන 2,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන තුන්සිය පනහකට (රු. 350,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 243 | — | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන |
| | | | පුනරාවර්තන වියදම් රු. 150,000,000 |
| | | | ප්‍රාග්ධන වියදම් රු. 200,000,000 |
| | | | මුළු වියදම රු. 350,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජූනි මස 23 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 5 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 4 දක්වා එකතුව රුපියල් 10,966,230,000.

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 249— වැඩසටහන 1,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක් දහස් පන්සීයයකට (රු. 1,500,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 249 | — | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | |
| වැඩ සටහන | 1 | — | මෙහෙයුම් වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු.1,500,000,000 |
| | | | | රු.1,500,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජුනි මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 5 දක්වා එකතුව රුපියල් 11,316,230,000.

*5.

අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 295— වැඩසටහන 2,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් අටසිය එක් කෝටි හැට හතර ලක්ෂයකට (රු. 8,016,400,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 295 | — | වාණිජ දෙපාර්තමේන්තුව | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 13,000,000 |
| | | | මූලධන වියදම් | රු.8,003,400,000 |
| | | | එකතුව | රු.8,016,400,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජුනි මස 23 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 2,949,830,000.

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 පෙබරවාරි මස 27 දිනැති අංක 1590/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 මාර්තු මස 04 දිනැති අංක 1591/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 මාර්තු මස 26 දිනැති අංක 1594/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 1),— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් මද්‍යසාර (රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණු කොට ) සඳහා වූ සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2009 මාර්තු මස 26 දිනැති අංක 1594/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009. 06. 23 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 907 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 2),— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥා පනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සඳහා වූ සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2009 මාර්තු මස 26 දිනැති අංක 1594/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009. 06. 23 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 908 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය (අංක 3),— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥා පනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සඳහා වූ සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2009 මාර්තු මස 26 දිනැති අංක 1594/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009. 06. 23 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 909 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින්, 2005 මාර්තු මස 31 දිනැති අංක 1386/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගවල I, II හා III යන උපලේඛන ඉවත්කර පනවන ලදුව, 2009 මාර්තු මස 31 දිනැති අංක 1595/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ප්‍රවාහන අමාත්‍යතුමා— පරිපූරක මුදල — ශීර්ෂය 114— වැඩසටහන 2,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දශ ලක්ෂ දෙදහස් දෙසීය අනූනමයයි දශම අටයි තුනකට (රු.ද.ල. 2,299.83) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 114 | — | ප්‍රවාහන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන කටයුතු | |
| | | | පුනරාවර්තන වියදම් | රු.ද.ල. 2,299.83 |
| | | | | රු.ද.ල. 2,299.83 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජූනි මස 12 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 450,000,000.

*15.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ඉන්දියානු ආගාමික කම්කරු  (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන)  පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*23.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*24.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*25.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*26.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*27.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*28.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*29.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04)[1]

*30.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*31.

අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචානාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*34.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*35.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*36.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*37.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*38.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

39.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

42.

පූජ්‍ය මුණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

43.

ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

“ පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය” යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0161/’09

1.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0162/'09

2.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0163/'09

3.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0164/'09

4.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0165/'09

5.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0166/'09

6.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0167/'09

7.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0168/'09

8.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0169/'09

9\.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0170/'09

10\.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0171/'09

11.

ගරු විජිත රණවීර මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුරාවස්තු ආඥාපනතට අනුව ආරක්ෂිත ස්මාරක ලෙස ගැසට් පත්‍රයේ පළකර ඇති ස්ථාන කවරේද යන්න අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහිතව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් පත්‍රයේ පළ කර නැති, එහෙත් ආරක්ෂිත ස්මාරක ලෙස දැනට හඳුනාගෙන ඇති ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ගැසට් පත්‍රයේ පළ කර ඇති ආරක්ෂිත ස්මාරක සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා මූල්‍ය පහසුකම් සලසා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0034/'09

12.

ගරු රවි කරුණානායක මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2004 වර්ෂය පාදක වර්ෂය ලෙස ගනිමින් 2004 සිට 2008 දක්වා කාලසීමාව තුළ කොළඹ දිස්ත්‍රික්කය හැර එක් එක් දිස්ත්‍රික්කයට අදාළව —

(i) සමෘද්ධිලාභීන් ලබා ඇති මුදල් ප්‍රමාණය රුපියල් වලින් කොපමණද;

(ii) එක් එක් වසරේ උද්ධමනය කොපමණද;

(iii) එක් එක් වසර තුළ උද්ධමනය අවකරණය කළ පසු මූර්ත ක්‍රය ශක්තිය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?